සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணஷலஹகஷ ஜட‍இண கஜபகஷகப்ல்
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 7 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper I /II | පැය / மணித்தியாலம் / Hours 02 |

නම
நகஅஉஷ ----------------------------------------
Name

සැලකිය යුතුයි.

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. I සහ II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I **කොටස**

- පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සමහර බස් රථ ඉබි ගමනින් ගමන් කිරීම නිසා මගීන්ට නියමිත වේලාවට රැකියාවලට යාමට නොහැකි වෙයි.
(1) නොසැලකිල්ලෙන් (2) ඉතා හෙමින් (3) නවත්වමින් (4) ඉතා වේගයෙන්

(02) නරක මිතුරන් සමග කිසිම ඇයි හොඳයියක් පැවැත්විය යුතු නැතැ'යි තාත්තා අපට කීවේ ය.
(1) සුහදතාවක් (2) සම්බන්ධයක් (3) තරහක් (4) විරුද්ධත්වයක්

(03) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ඓතිහාසික - ග්‍රන්ථාරූඪ (2) පුරාවිද්‍යාඥ - ලාංචනය
(3) තාක්ෂණය - ප්‍රතිශක්තිකරණ (4) සංවර්දනය - කෞතුකාගාරය

- මුලින් දී ඇති පදයට සමාන අර්ථය **නොදෙන** පදය තෝරන්න.

(04) සාගරය - (1) සිඳු (2) සයුර (3) මුහුද (4) නදිය

- මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

(05) අවබෝධ - (1) පලිබෝධ (2) අනවබෝධ (3) සුබෝධ (4) ආබාධ

(06) ''ලෙඩ කපුටෝ වැල කනවා වාගෙයි. යන ප්‍රස්තාව පිරුළට වඩාත් සමීප අර්ථය වන්නේ,
(1) ඉතා ඉක්මනින් වැඩක් කිරීම (2) නුසුදුසු වැඩක් කිරීම
(3) ඕනැවට එපාවට යම් වැඩක් කිරීම (4) අකැමැත්තෙන් යම් වැඩක් කිරීම

- ප්‍රශ්න අංක 7-8, වාක්‍යාංශ වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

(07) යමෙකු හෝ යමක් සිහිපත් කිරීම.
(1) ස්මරණය (2) අනුස්මරණය (3) මතකය (4) සිහිකැඳවීම

(08) ''කළ ගුණ නොසලකන''
(1) අකෘතඥ (2) අපායගාමී (3) කෘතඥ (4) අකාරුණික

(09) අභිමානය යන පදය අයත් වන්නේ,

(1) නාම විශේෂණ පදවලට යි (2) ක්‍රියා විශේෂණ පදවලට යි
(3) අනවසාන ක්‍රියා පදවලට යි (4) උපසර්ග පදවලට යි

(10) ''ඔවුහු'' යන පදය අයත් වන්නේ,

(1) උත්තම පුරුෂ ඒක වචනයට යි. (2) මධ්‍යම පුරුෂ බහු වචනයට යි.

(3) ප්‍රථම පුරුෂ බහු වචනයට යි. (4) මධ්‍යම පුරුෂ ඒක වචනයට යි.

- එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියා පද වර්ගය අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(11) ☼ කුරුල්ලෝ ආහාර <u>සොයමින්</u> පියාඹති.

☼ මුද්දරය <u>අලවා</u> ලියුම තැපැල් කළ යුතු ය.

☼ අම්මා බත් <u>පිසුවා ය</u>.

(1) අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා

(12) නිවැරදි ව පද වෙන් කර ලියා ඇති වාක්‍යය වන්නේ,

(1) ගස් වලින් පිරි සිදු වාතාශ්‍රය ලබමු (2) නිව හල් දේශය ක් ගොඩ නගමු
(3) ශිල්පී හු තම වැඩකටයුතු වල නියැලෙති (4) ජාතියේ අභිමානය සුරකිමු

(13) ☼ ඉනිබ්බේ ☼ උරණව ☼ ආචාරි භාග ☼ නිග්‍රහ

ඉහත සඳහන් පදවල අරුත් පැහැදිලි කළ විට නිවැරදි පිළිවෙළ වන්නේ,

(1) ඊට පසුව, කෝප වී, ගුරු පඬුරු, අවමාන (2) කෝප වී, ඊට පසුව, අවමාන, ගුරු පඬුරු
(3) ගුරු පඬුරු, අවමාන, කෝප වී, ඊට පසුව (4) ඊට පසුව, කෝප වී, අවමානය, ගුරු පඬුරු

(14) දිය බිඳුවක <u>ගැලී ගැලී</u>

ඉහත කාව්‍ය පාදයේ ඉරි ඇඳි කොටසේ කාව්‍ය උපක්‍රමය වන්නේ,

(1) එළිසමය යි (2) උපමාවකි (3) රූපකයකි (4) අනුප්‍රාසය යි

(15) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතාගේ කාව්‍ය නිර්මාණ නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) වැස්ස, සිනා කුමාරි, වෙසක් මිහිර (2) වෙසක් මිහිර, ඇත්ගාලේ දරු පෙම, මගේ රට
(3) රාත්‍රිය, සේපාලිකා, මගේ රට (4) මගේ රට, වැස්ස, සිනා කුමාරි

(16) ................................ හොඳින් ඉගෙන රටේ සංවර්ධනයට උර දෙමු.

(1) ඔහු (2) මම (3) නුඹ (4) අපි

(17) ................................ ඉතා මිහිරි ලෙස ගීයක් ගායනා කළා ය.

(1) දැරියක් (2) දැරියක (3) දැරියකු (4) දැරියන්

(18) වෛද්‍යවරු ........................ සුවපත් කරති.

(1) රෝගියෝ (2) රෝගීන් (3) රෝගීහු (4) රෝගියෙක්

(19) අතීතයේ රජවරු දැහැමෙන් සෙමෙන් රට පාලනය ........................

(1) කළෝ ය (2) කළේ ය (3) කළෙමි (4) කළෙහු

(20) තාරකා පෙළ අහසේ අලංකාර ව ............................

(1) බබළයි (2) බබළති (3) බබළන්නෝ ය (4) බැබළුනහ

(ලකුණු 2x20=40)